

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | CSS/7/5/6/1 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2015.07. 16 |

## ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 07-2015

දකුණු පළාතේ සියළුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන් දීමේ නිලධාරීන් වෙත.

<u>රාජකාරී විදේශ ගමන් සඳහා විනිමය මුදාහැරීම හා ඒ ආශ්‍රිත වියදම්</u>

උක්ත කරුණ සම්බන්ධව මුදල් අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති 2015.05.15 දිනැති අංක මු.අ. 01 /2015/01 දරණ චක්‍රලේඛය සම්බන්ධයෙනි.(එම චක්‍රලේඛයේ පිටපතක් මේ සමඟ අමුණා එවමි.)

02. එම චක්‍රලේඛය මඟින් සාකච්ජා, සම්මන්ත්‍රණ පුහුණු වැඩසටහන් ඇතුළුව සියළුම රාජකාරී කටයුතු සඳහා විදේශගත වන නිලධාරීන්ට ගෙවිය යුතු සංශෝධිත දීමනා සම්බන්ධ විධිවිධාන ඇතුළත් කරමින් උපදෙස් නිකුත් කර ඇත.

03. මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ එම චක්‍රලේඛය දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.

04. ඒ අනුව රාජකාරී විදේශ ගමන් සඳහා විනිමය මුදාහැරීමේදී හා ඒ ආශ්‍රිත වියදම් දැරීමේදී මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ මු.අ. 01/2015/01 චක්‍රලේඛයේ සඳහන් උපදෙස් අනුව කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.තවද මේ සම්බන්ධයෙන් ඔබගේ යටත් ආයතන දැනුවත් කරන ලෙසද දන්වා සිටිමි.

ඩබ්ලිව්.කේ.කේ.අතුකෝරල
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත් :

01. සහකාර විගණකාධිපති, දකුණු පළාත : දැ.ගැ.ස.
02. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත් සභාව : දැ.ගැ.ස.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office 091 2234052, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின்அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இணையம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස් එච්.දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக்க மாவத்தை, காலி.
"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"